**වවුනියා නගර සභාව**
**වවුනියා දිස්ත්‍රික්කය**
**-------------------------------**

**1.** මූල්‍ය ප්‍රකාශන
---------------------------

**1.1** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
------------------------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ඔක්තෝබර් 13 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කර ඇත.

**1.2** **තත්ත්වාගණනය කළ මතය**
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට වවුනියා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
-------------------------------------

**1.3.1** **ගිණුම්කරණ අඩුපාඩු**
---------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පරිත්‍යාග ලෙස ලැබී තිබුණු නගර සභාවේ මෝටර් වාහන 31 ක අයිතිය සභාවට පවරා ගෙන නොතිබූ අතර ඒවායේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. එබැවින්, මෝටර් වාහන වටිනාකම ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) පරිත්‍යාග ලෙස නිකුත් කර තිබුණු නගර සභාවේ මෝටර් වාහන 16 ක අයිතිය නගර සභාවට මාරු කර තිබුණි. කෙසේ වුවද, ඒවායේ වටිනාකම අගය කර ගිණුම්ගත කර නොතිබූ බැවින් මෝටර් වාහන වටිනාකම ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2012 වර්ෂයේ සිට විගණිත වර්ෂය දක්වා කුඩිඉරිප්පු ළමා උද්‍යානය බාහිර ආයතනයකට බදු දී තිබුණි. කෙසේ වුවද, ඒ සඳහා ලැබිය යුතු රු.250,000 ක් වූ බදු කුලී ආදායම් ගිණුමට ගෙන නොතිබූ බැවින් ගිණුම්වල සමුච්චිත අරමුදල අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.2** **විගණනය සඳහා සාක්ෂි නොවීම**
--------------------------------------

රු.524,414 ක් වටිනා ගනුදෙනු 17 ක් අවශ්‍ය සාක්ෂි නොමැති වීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

**1.3.3** **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**
-------------------------------------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) නීති හා රීති | |
| නගර සභා ආඥා පනතේ 44(2) වගන්තිය | සභාවට අයත් මාර්ග හා මංමාවත් පිළිබඳ උපලේඛන වර්ෂ 3 ක් ඇතුළත රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ යුතු වුවද නගර සභාව ස්ථාපිත කිරීමේ සිටම එසේ සිදුකර නොතිබුණි. |
| III පරිච්ඡේදයේ 54(1) වගන්තිය | වරිපනම් හා බදු පිළිබඳ උපලේඛන වර්ෂයේ නොවැම්බර් 15 දිනට පෙර ලේකම්වරයාට ඉදිරිපත් කළ යුතු අතර ගෙවීම් වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සිදු කළ යුතු නමුත් එයද ක්‍රියාත්මක කර නොතිබුණි. |
| VII පරිච්ඡේදයේ 171 වගන්තිය | මුදල් පොත හා අනෙකුත් ලේඛන ලේකම්වරයා විසින් දිනපතා පරීක්ෂා කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 316(2) | දෛනික මුදල් ශේෂයන්ට අදාළව සහ සුරක්ෂිත භාරයේ තබා ඇති විෂයයන්ට අදාළව ලේඛන පවත්වා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 381(3) | චෙක්පත් අත්සන් කිරීමට බලය ලත් නිලධාරීන් විසින් ඇප මුදල් තබා නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 751 (2) | සභාවේ විදුලි සවිකිරීම් හා උපකරණවලට අදාළ ඉන්වෙන්ට්‍රි ලේඛනය වෙනම පවත්වා සටහන් කර නොතිබුණි. |
| (ඇ) චක්‍රලේඛ | |
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛය | සභාවේ මෝටර් වාහනවල ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කර නොතිබුණි. |

## 1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ඉකුත් වර්ෂවල පිටතට මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.589,665 ක් වූ සේවක ණය ශේෂ අයකර ගැනීම සඳහා අර්ථවත් හෝ නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) භාරතී ප්‍රජා මධ්‍යස්ථානය සම්බන්ධයෙන් පළමු, දෙවන හා අවසාන ගෙවීම්වලට අදාළ රු.67,463 ක් වූ රඳවා ගැනීම් මුදල් අදාළ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීමෙන් තොරව 2015 වර්ෂයේ සිට තැන්පතු ගිණුමේ තබා තිබුණි.

(ඇ) දිගුකාලයක සිට එකතුව රු.10,196,715 ක් වූ බැරකම් හා හිඟ ණයගැතියන් නිරවුල් කරගැනීම සඳහා අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.37,569,664 ක ශුද්ධ අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.10,846,353 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රතිඵලවල රු.26,723,311 ක වර්ධනයක් දැක්වුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛනයට අනුව, නගර සභා බල ප්‍රදේශය තුළ අයකර ගත යුතු වරිපනම් හා බදු අයකර ගැනීම ඉතා අඩු මට්ටමක පැවති අතර වාර්ෂික හිඟ වරිපනම් හා බදු වැඩි වී තිබුණි. විස්තර පහත පරිදි වේ.

| වර්ෂය | හිඟ බදු |
|---|---|
| | රු. |
| 2014.12.31 | 34,599,229 |
| 2015.12.31 | 38,197,727 |
| 2016.12.31 | 45,217,168 |

#### 2.2.2 වරිපනම් හා බදු

දේපල පිළිබඳ වරිපනම් බදු සඳහා ප්‍රත්‍යාගණනයක් පසුගිය වර්ෂ 6 ක කාලයක් තුළ සිදුකර නොතිබූ බැවින්, වරිපනම් හා බදු අයකර ගැනීම පහළ මට්ටමක පැවතුණි.

#### 2.2.3 බදු කුලී

(අ) සභාව විසින් එකතුව රු.4,837,853 ක් වූ සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ සඳහා බදු කුලී අයකර ගෙන නොතිබුණි.

(ආ) කඩ කාමර 82 ක අයිතිකරුවන්ගෙන් බදු කුලී අයකර ගෙන තිබුණද, එම කඩ කාමර භාරදුන් දිනයේ සිටම ඔවුන් සමඟ ගිවිසුමක් අත්සන් කර නොතිබුණි.

(ඇ) කඩ කාමර 276 ක අයිතිකරුවන්ගෙන් බදු කුලී අයකර ගෙන තිබුණද ඔවුන් සමඟ නැවත ගිවිසුමකට එළඹී නොතිබුණි.

(ඈ) 2009 වර්ෂයෙන් පසුව ව්‍යාපාර සමාලෝචනය කර බලපත්‍ර ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබූ බැවින් ආදායම වැඩි කරගැනීමට තිබූ අවස්ථා මඟ හැරී තිබුණි.

(ඉ) වර්ෂ ගණනකට පෙර ටෙන්ඩර් කැඳවීම් ක්‍රියාවලිය මඟින් ගිවිසුම්කරුවන් 265 දෙනෙකු සභාවට අයත් කඩ කාමර ලබාගෙන තිබුණි. කෙසේ වුවද, සමහර ගිවිසුම්කරුවන් එම කඩ කාමර වෙනත් පුද්ගලයන්ට විකුණා තිබූ අතර සමහර ගිවිසුම්කරුවන් ඉතා වැඩි රේටයන්ට

එම කඩ කාමර බදු දී තිබුණි. එබැවින් ලැබිය යුතු රු.61,800,000 ක මුදලක් ලබාගෙන නොතිබුණි.

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**------------------------------**

**උසාවි දඩ මුදල්**

**-----------------**

2016 වර්ෂය සඳහා රු.5,216,117 ක් වූ උසාවි දඩ මුදල් සභාව විසින් අය කරගැනීමෙන් තොරව හිඟ හිට පැවතුණි.

**මුද්දර ගාස්තු**

**---------------**

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ සඳහා රු.17,341,613 ක් වූ මුද්දර ගාස්තු ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අයකර ගෙන නොතිබුණි.

**2.2.5 විනෝද බදු**

**-------------**

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ සඳහා රු.1,138,190 ක් වූ විනෝද බදු සභාව විසින් අයකරගෙන නොතිබුණි.

2.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

(අ) පරිත්‍යාග ලෙස ලබාගත් මෝටර් වාහන 10 ක් ලියාපදිංචි කිරීමේ සහතිකය නොමැතිව පැවතුණි.

(ආ) සභාවේ ට්‍රැක්ටර් 12 ක ධාවනය කරන ලද කිලෝමීටර් ගණන දැක්වෙන මීටර් හානි වී තිබුණි.

(ඇ) නාමයන් මාරු කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට භාර දී තිබූ ඉල්ලුම්පත් 97 කින් ඉල්ලුම්පත් 70 කට අනුමැතිය ලබා දී තිබූ අතර ඉල්ලුම්පත් 27 ක් සඳහා අනුමැතිය ලබා දී නොතිබුණි.

(ඈ) 2016 වර්ෂයේදී ගොඩනැගිලි සඳහා අනුමැතිය ලබා ගැනීමට සභාවට භාර දී තිබූ ඉල්ලුම්පත් 45 කින් ඉල්ලුම්පත් 31 කට අනුමැතිය ලබා දී තිබූ අතර ඉල්ලුම්පත් 14 කට අනුමැතිය ලබා දී නොතිබුණි.

(ඉ) පුස්තකාල ගොඩනැගිලි අරමුදල් තැන්පතු රු.671,373 ක් අරමුණු කළ කාර්යයන් සඳහා උපයෝජනය කිරීමෙන් තොරව පැවතුණි.

(ඊ) 2016 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිවෙලින් 183 ක් හා 168 ක් විය. එබැවින්, පුරප්පාඩු 16 ක් විගණනයේදී නිරීක්ෂණය විය.

(උ) සභාවේ ලේකම්වරයා විසින් ස්ථිර කාමරයක් භාවිතා කර නොතිබුණි.එබැවින්, වාර්ෂිකව එක් එක් කාමර සභාවේ අරමුදල්වලින් අලුත්වැඩියා කර සභාවේ ලේකම්වරුන් විසින් භාවිතා කර තිබුණි.ඒ අනුව, 2016 පෙබරවාරි 08 දින ලේකම්වරයා සඳහා රු.152,300 ක පිරිවැයකට කාමරයක් ඉදිකරන ලද අතර, එම ලේකම්වරයා මාරු වී ගොස් තිබුණි. එහෙත් අලුතෙන් තනතුර භාරගත් ලේකම්වරයා විසින් එම කාමරය භාවිතා කර නොතිබුණි. ලේකම්වරයාගේ කාමරය ලෙස වෙනත් කාමරයක් භාවිතා කර තිබූ බැවින් ඉහත දක්වන ලද කාමරයේ සවිකිරීම් ඉවත් කර දැනට ආදායම් අංශය ලෙස භාවිතා කරන බව නිරීක්ෂණය විය.

(ඍ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.9.1(ආ) මාර්ගෝපදේශය අනුව, රු.500,000 කට වඩා වටිනා භාණ්ඩ හා සේවා සඳහා කොන්ත්‍රාත්තුවකට එළඹිය යුතුය. කෙසේ වුවද, සභාවේ අරමුදල්වලින් මිලදී ගෙන තිබුණු රු.1,713,000 ක් වූ ක්‍රීඩා උපකරණ සඳහා කොන්ත්‍රාත්තුවකට එළඹී නොතිබුණි.

(එ) කොන්ත්‍රාත්තුවේ අංක 166 දරන විෂයය හා ඉහත වැඩ සැලැස්මේ ඇස්තමේන්තුව අනුව කියුබ් 12 ක් වැලි පිරවීම සඳහා රු.88,800 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් සිදු කරන ලද භෞතික පරීක්ෂණය අනුව, ඉහත ප්‍රදේශය වැලි කියුබ් 7.294 කින් පමණක් පුරවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, රු.53,976 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඒ) කොන්ත්‍රාත්තුවේ අංක ඩී 13 දරන විෂයය හා ඉහත වැඩ සැලැස්මේ ගිවිසුම අනුව, පැරණි ක්‍රීඩා උපකරණ අලුත්වැඩියා කිරීම සඳහා රු.178,043 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, විගණන නියැදි පරීක්ෂණවලදී එවැනි උපකරණ උද්‍යානයේ නොතිබුණි.

(ඔ) රු.26,584 ක් වටිනා පොත් 162 ක් සභාවේ පුස්තකාලයේදී අස්ථාන ගත වී තිබුණි. කෙසේ වුවද, මෙම පොත් ආපසු ලබාගැනීම සඳහා අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ කරන ලද රු.7,540,000 ක් වටිනා වැඩ සැලසුම් සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබුණි.

(ආ) නගර සභා බල ප්‍රදේශය තුළ අනවසර ගොඩනැගිලි ඉවත් කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් මේ දක්වා අනුමැතිය ලබා දී නොතිබුණි. ස්ථාන 14 ක අනවසර ඉදිකිරීම් 149 ක් තිබූ බව භෞතික පරීක්ෂණයේදී හඳුනාගන්නා ලදී. කෙසේ වුවද, නාගරික සංවර්ධන අධිකාරියේ 1982 අංක 4 දරන නාගරික සංවර්ධන (සංශෝධන) පනතේ විධිවිධානවලට අනුව, අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) නගර සභා බල ප්‍රදේශය තුළ විදුලි සංදේශ ආයතන 5 ක් විසින් ඉදිකරන ලද විදුලි සංදේශ කුළුණුවලට අදාළව සංඛ්‍යාව හා උස සැලකිල්ලට ගැනීම මඟින් කොන්ත්‍රාත්තුවකට එළඹ නොතිබුණු අතර ඒ සඳහා කිසිදු ගාස්තුවක් මේ දක්වා අයකර නොතිබුණි.

## 2.5 කොන්ත්‍රාත් පරිපාලනය

නගර සභාවේ රු.9,768,256 ක පිරිවැයකට ප්‍රතිසංස්කරණය කරන ලද පොදු උද්‍යානයට අදාළ අඩුපාඩු පහත පරිදි වේ.

(අ) ඉහත ඉදිකිරීම් වැඩ සැලැස්මේ කොන්ත්‍රාත්තුවේ D1, D2 විෂයය අංක හා ගිවිසුම අනුව උද්‍යානයේ පස් පිරවීම හා ෂටරින් ගැසීම් වැඩ සඳහා කොන්ත්‍රාත්කරුට රු.777,200 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, විධිමත් නොවූ පස් පිරවීම් හා ෂටරින් ගැසීම් හේතුවෙන් වැසි ජලය ස්ථාන රාශියක රැඳී තිබුණු අතර පොළව සමතලා මට්ටමකද නොවීය.

(ආ) ඉහත ඉදිකිරීම් වැඩ සැලැස්මේ කොන්ත්‍රාත් විෂයය අංක ඩී 7 හා ගිවිසුම අනුව රු.200,000 ක් වටිනාකමට ෆයිබර් ග්ලාස් යොදා දිය ඇල්ලක් ඉදිකළ යුතු විය. කෙසේ වුවද, සම්පූර්ණ දිය ඇල්ලම රු.199,995 ක පිරිවැයට සිමෙන්ති යොදා ඉදිකර තිබුණි.

(ඈ) ඉහත ඉදිකිරීම් වැඩ සැලැස්මේ කොන්ත්‍රාත් විෂය අංක ඩී 10 හා ගිවිසුම අනුව, පුටු හා මේස කට්ටල සඳහා රු.125,000 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත්තුවට අනුව පුටු හා මේස කට්ටල සමාන ප්‍රමාණයක් ඉදිකර නොතිබුණි.

(ඇ) ඉහත ඉදිකිරීම් වැඩ සැලැස්මේ කොන්ත්‍රාත් විෂය අංක ඩී 04 හා ගිවිසුම අනුව රු.493,080 ක පිරිවැයකට ඉදිකරන ලද අභ්‍යන්තර මාර්ගය විධිමත්ව නිම කර නොතිබුණු අතර පිපිරීම් හා හානිවීම් ස්ථාන කිහිපයක දක්නට ලැබුණි.

(ඉ) ඉහත ඉදිකිරීම් වැඩ සැලැස්මේ කොන්ත්‍රාත් විෂය අංක ඩී 05 හා ගිවිසුම අනුව තණ කොළ ඇතිරීම සඳහා රු.36,457 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. කෙසේ වුවද, එය විධිමත්ව සිදු කර නොතිබූ අතර තණ කොළ බොහෝ ස්ථානවල අතුරා නොතිබුණි.

(ඊ) සභාවේ අරමුදල් යොදා ගනිමින් රු.1,713,000 ක පිරිවැයකට ෆයිබර් ක්‍රීඩා උපකරණ මිලදී ගෙන උද්‍යානයේ සවිකර තිබුණි. කෙසේ වුවද, එම උපකරණවල විධිමත් නොවූ ස්වභාවය හේතුවෙන් උපකරණවල පිපිරීම් හා හානි වීම් තිබූ බව නිරීක්ෂණය විය.

(උ) මෙරිගෝ රවුන්ඩ් ක්‍රීඩා උපකරණ අලුත්වැඩියා කිරීම සඳහා යොදා ගන්නා ලද රු.75,935 ක් වටිනා තෙකලා විදුලි උපකරණවලට අදාළව ව්‍යාජ බිල්පතක් සකස් කර විගණනයට ඉදිරිපත් කර තිබූ බව නිරීක්ෂණය විය.

## 2.6 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 2.6.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රසම්පාදන තීරණ පිළිබඳ දිනයන්, තීරණ සිදුකරන ලද සාමාජිකයන්ගේ නම් හා තනතුරු, ප්‍රසම්පාදන තීරණ අංක, ප්‍රසම්පාදන තීරණ පිළිබඳ සහතික කිරීමේ පිටපත් යනාදී විස්තර සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මේ නොතිබුණි.

### 2.6.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණකවරයකු සභාවේ කාර්යයන් කාර්යක්ෂමව සිදුකිරීම සඳහා පත් කළ යුතුය. කෙසේ වුවද, සභාවේ අභ්‍යන්තර විගණකවරයකු පත් කර තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන කාර්යයන් පිළිබඳ වාර්තා විධිමත්ව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.6.3 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

සභාවේ කාර්යයන් කාර්යක්ෂමව සිදුකිරීම සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා තිබුණද, රැස්වීම් වාර්තා නිසි පරිදි ඉදිරිපත් කර නොතිබුණි.

## 2.7 වත්කම් කළමනාකරණය

### (අ) නිෂ්කාර්ය වත්කම්

රු.996,792 ක් වටිනා භාණ්ඩ වර්ෂ 2 කට වැඩි කාලයක් සභාවේ ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

2016 වර්ෂය සඳහා සභාවේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2017 මාර්තු 23, 24, 27, 28, 29 හා 30 දිනවල පවත්වා තිබුණු අතර ඒ පිළිබඳ වාර්තා විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2018 අප්‍රේල් 05 දින දීය.

**2.8 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

(අ) නගර සභා බල ප්‍රදේශය තුළ ඝන අපද්‍රව්‍ය අපහරණය කිරීම සඳහා සුදුසු ස්ථානයක් නොතිබුණි. එබැවින්, වවුනියා දෙමළ ප්‍රාදේශීය සභාව විසින් අපද්‍රව්‍ය අපහරණය කිරීම සඳහා යොදා ගන්නා ලද ස්ථානය ඔවුන්ගේ අනුමැතිය සහිතව ඝන අපද්‍රව්‍ය විනාශ කිරීම සඳහා යොදාගෙන තිබුණි.

(ආ) වෙන් කිරීමකින් තොරව ඝන අපද්‍රව්‍ය ගොඩගසා තිබුණි.

(ඇ) ඝන අපද්‍රව්‍ය සඳහා කොම්පෝස්ට් කිරීම හා චක්‍රීයකරණය කිරීම් ක්‍රම යොදා ගෙන නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(i) මෝටර් වාහන උපයෝජනය
(ii) අයවැය ලේඛනය
(iii) ආදායම රැස්කිරීම
(iv) කඩ කාමර කුලී සඳහා කොන්ත්‍රාත්
(v) ස්ථාවර වත්කම්